සැ. යු.- 2017.12.08 දින පළ වූ අංක 2,049 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,050 - 2017 දෙසැම්බර් මස 15 වැනි සිකුරාදා - 2017.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 4216 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජනවාරි මස 05 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 දෙසැම්බර් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ඇමුණුම 01

**සංශෝධනයයි**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්/විදුලි)/සැලසුම් ශිල්පී තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ විභාගයට අදළව 2017.09.22 දින පළවූ *ගැසට් නිවේදනය* සම්බන්ධවයි. එම *ගැසට් නිවේදනයේ* 6.1 ඡේදයේ සඳහන් විෂය නිර්දේශය පහත පරිදි සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.

6.1 ***විෂය නිර්දේශය :***

01. බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01 - ලකුණු 100)

අයැදුම්කරුවන්ගේ භාෂා හැකියාව , ගණිතමය කුසලතාවය සහ තර්කන ශක්තිය, මැන බැලීම සඳහා සකස් කරනු ලබන කෙටි හා බහුවරණ ශෛලියේ ප්‍රශ්න වලින් සමන්විත වේ.

02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (කාලය පැය 03 - ලකුණු 100)

*(අ)* කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය, කාර්මික නිලධාරී (සිවිල්) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණිය :

ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ජල සම්පාදනය හා ජලවහනය, අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිබඳව අපේක්ෂකයා සතු සහජ හැකියාව විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.

*(ආ)* කාර්මික නිලධාරී (විදුලි) III ශ්‍රේණිය , කාර්මික නිලධාරී (විදුලි) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණිය :

විදුලි පරිපථ සැලැස්මක් කියවා වටහා ගැනීමේ හැකියාව , විදුලි පිහිටුවුමකදී අනුගමනය කළ යුතු රෙගුලාසි පිළිබඳ දැනුම, ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු වලට අදාළ විදුලි පරිපථ සඳහා ඇස්තමේන්තුව සකස් කිරීම පිළිබඳ දැනුම.

*(ඇ)* සැලසුම් ශිල්පී එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණිය :

ගොඩනැගිලි නිර්මාණ ශිල්පය පිළිබඳ දැනුම, ප්‍රමාණයට අනුව ඇඳීම, සැලැස්මක් හෝ දළ සටහනක් තේරුම් ගැනීමේ හැකියාව, ව්‍යුහගත නිර්මාණයන් පිළිබඳ මූලික දැනුම, සමීක්ෂණ පිළිබඳ දැනුම, ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න ඇතුළත් වනු ඇත.

මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය වන ජ්‍යාමිතික උපකරණ හා සෙසු උපාංග අයැදුම්කරු විසින් විභාග ශාලාවට රැගෙන ආ යුතුය.

පද්මිණී කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 නොවැම්බර් මස 23 වැනි දින,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

12-508

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.